**ගාලු උරුමය පදනම - 2018**
**---------------------------------**

## 1.1 අහිතකර මතය
**------------------**

ගාලු උරුමය පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් ගාලු උරුමය පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. අහිතකර මතය සඳහා පදනම
**------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව වාර්තාව සඳහා අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ගාලු උරුමය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ගාලු උරුමය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගාලු උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ගාලු උරුමය පදනම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ගාලු උරුමය පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ගාලු උරුමය පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම හා වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් මනා ලෙස සැලසුම් කරන ලද අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | ------------------------ | ------------- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි දැක්වෙන ගිණුම් ආකෘතිය ප්‍රකාරව ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණු අතර එහි රු.66,497,881 ක එකතුව පමණක් ශේෂ පත්‍රයෙහි දක්වා තිබුණි. | ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය පිළියෙල කිරීම ඉදිරි මූල්‍ය ප්රකාශන තුළ නිවැරදිව ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි දැක්වෙන අවශ්‍යතාවයන් අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත දැක්වෙන බැහැරවීම් නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ වෙනත් ලැබිය යුතු දෑ, ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.1,390,770 ක් අඩු වී තිබුණද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.227,236 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සංඛ්‍යා ඉකුත් වර්ෂ සමඟ සැසඳීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂයට රු.1,435,609 ක ස්ථාවර තැන්පත් පොළී ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙනම දැක්විය යුතු වුවද එසේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ පොළී ලැබීම් තැන්පතු මත ප්‍රති ආයෝජනය වී ඇති අතර භෞතිකව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට බලපෑමක් සිදු වී නොමැති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා නොමැත. | - එම - |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් අත්පත් කර ගන්නා වර්ෂයට සහ ඉවත් කරන වර්ෂයට අදාළ ක්ෂය ප්‍රතිපත්තිය හා ආයෝජන ගිණුම්ගත කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගාලු උරුමය පදනම දේපල, පිරියත සහ උපකරණ ක්ෂය කරනුයේ වත්කම් අත්පත් කරගත් දින සිට ඒ ඒ වර්ගීකරණයේ වාර්ෂික ක්ෂය අනුපාතය පදනම් කර ගෙනය. ප්‍රතිපත්තිය ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් කිරීමට සටහන් කර ගතිමි. | ස්ථාවර වත්කම් ක්ෂය කිරීම් සම්බන්ධව ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.12,000,000 ක් වූ ස්ථාවර තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය රු.1,530,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙ යටතේ පෙන්වා ඇති ස්ථාවර තැන්පතුව වර්ෂ තුනකින් කල් පිරීමට නියමිත තැන්පතුවකි. අදාල පොළී ගැලපීම 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සමුච්චිත අරමුදලට බැර කිරීමෙන් නිවැරදි කිරීමට සටහන් කර ගතිමි | වර්ෂයට අදාළ පොලිය උපචිත පදනම මත වර්ෂයේ ආදායමට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික සඳහා ඌන වෙන්කිරීම රු.651,315 ක් වූයෙන් වර්ෂයේ ඌනතාවය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම ඌණ වෙන් කිරීම 2019 වර්ෂයේ සමුච්චිත අරමුදලට හර කිරීමෙන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සටහන් කර ගතිමි. | වෙන් කිරීම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | රු.1,870,747 ක් වූ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස නොදක්වා අසම්භාව්‍ය වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අසම්භාව්‍ය වත්කම් යටතේ ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා දැරූ වියදම පෙන්වීම වැරැද්දක් ලෙස පිළිගන්නා අතර එය විලම්භිත වත්කමක් ලෙසට නිවැරදි විය යුතුය. මේ අනුව මෙය, නිවැරදිව කරුණු සඳහන් කොට 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරමි. | වර්ෂයේ වියදම් ආදායමට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවේ පෙන්වා දී තිබූ එකතුව රු.2,063,583 ක් වූ නොසැසඳීම්, සැසඳීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ලියා හැර තිබුණි. | මෙය වැරදි නිවැරදි කිරීමක් ලෙස සිදුකොට ඇත. අදාළ ජර්නල් සටහන් ගිණුම් කට්ටලය තුළ පෙන්වා ඇත. | වැරදි නිවැරදි කිරීම් නිසි පරිදි හඳුනා ගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ගැලපීම් කළ යුතුය. |
| (ඉ) | විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ පත්‍රයේ දක්වා තිබුණු ලැබිය යුතු සේවක ණය ගිණුමේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන සමග වූ උපලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.113,594 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් අදාළ උපලේඛන සමඟ ගලපා නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව බැංකු ජංගම ගිණුමේ ශේෂය ශුන්‍ය අගයක් ගෙන තිබුණද, ශේෂ පත්‍රය අනුව බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.1,056,213 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවත් මුදල් පොතට පරිබාහිරව සිදුකර තිබුණු ගැලපීම් පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මේ පිළිබඳ නිශ්චිත පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් විය. | මේ යටතේ දක්වා ඇත්තේ වැරදි නිවැරදි කිරීමකි. මෙය ජර්නල් සටහන් තුළින්ද ගිණුම් කට්ටලය තුළ පන්වා ඇත. | අදාළ ගැලපීම්වල විස්තර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ දක්වා තිබුණු රු.4,712,294 ක් වූ වත්කම්, සහ රු.3,236,142 ක වගකීම් වැරදි නිවැරදි කිරිම් සහ රු.4,381,075 ක් වූ ලාභයට වැරදි ලෙස ගැලපීම් සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්රකාශනවල දක්වා ඇති ආරම්භක ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | අදහස් දක්වා නැත | විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කළ යුතු අතර නිවැරදි සංසන්දනාත්මක ශේෂයන් පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති අනෙකුත් ලැබිය යුතු දෑ වලින් රු.1,180,703 ක් වූ ලැබිය යුතු ශේෂ කිසිඳු අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලින් කපා හැරීම නිසා අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කට්ටලය සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. තවද මෙය වැරදි නිවැරදි කිරීමක් ලෙස සිදුකොට ඇත. අදාළ ජ'නල් සටහන් ගිණුම් කට්ටලය තුළ පෙන්වා ඇත. | සම්මුච්ත අරමුදලින් කපා හැරීමට අනුමැතිය ලබා ගත යුතුය. වැරදි නිවැරදි කිරීම් මොනවාද යන්න නිවැරදිව හඳුනා ගෙන අදාළ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ස්ථාවර වත්කම් | 39,553,151 | (i) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා | ඉල්ලා ඇති තොරතුරු ඉදිරියේදී ඔබ වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති ජංගම නොවන වත්කම් ශේෂයන් සඳහා යාවත්කාලීන කරන ලද නිවැරදි වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීමට ක්‍රියාකළ යුතුය. |
| තොගය | 792,865 | (i) තොග පොත<br>(ii) විස්තරාත්මක තොග ලේඛන<br>(iii) තොග කාල විශ්ලේෂණ | - එම - | තොග පොත, විස්තරාත්මක තොග ලේඛන, තොග කාල විශ්ලේෂණ කඩිනමින් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| වෙනත් ලැබිය යුතු ගිණුම් | 1,592,427 | (i) ලැබිය යුතු ගිණුම් සඳහා ලේඛන<br>(ii) ශේෂ සනාථ සහතික<br>(iii) කාලවිශ්ලේෂණය | - එම - | ලැබිය යුතු ගිණුම් ශේෂ සනාථ කර ගැනීම සඳහා පෙන්වා දී ඇති විස්තර ඉදිරිපත් කිරීමට ක්‍රියා කල යුතුය. |

**1.5.6 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 137 | අනුමත කරන ලද වවුචර්පත් වලට පමණක් ගෙවීම් කළ යුතු වුවද, රු.2,359,565 ක් වටිනා වවුචර් 46 ක් අනුමත කිරිමකින් තොරව ගෙවා තිබුණි. | මෙම වවුචර්පත් 46 ට අදාළ විස්තරාත්මක ලේඛණයක් ගාලු උරුමය පදනම වෙත ලබා දෙන ලෙසට ඉල්ලා සිටින අතර ඉන් අනතුරුව මේ සම්බන්දයෙන් වන කරුණු දැක්වීම සිදු කිරීමට අපේක්ෂා කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පදනමේ කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා නිලධාරීන් දැනුවත් කළ යුතු අතර මේ සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 168 (1) | ඕනෑම නිලධාරියකුට රජය වෙනුවෙන් මුදලක් ලැබුණු විට, ඔහු විසින් නියමිත ආකෘති පත්‍රයෙහි යන්ත්‍රානුසාරයෙන් අංක කරන ලද කාර්යාලීය කුවිතාන්සියක් වහාම නිකුත් කළ යුතු වුවද, එකතුව රු.869,085 ක් වටිනා තැන්පතු 35 ක් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. | මෙම තැන්පතු 35 ට අදාළ විස්තරාත්මක ලේඛණයකි ගාලු උරුමය පදනම වෙත ලබා දෙන ලෙසට ඉල්ලා සිටින අතර ඉන් අනතුරුව මේ සම්බන්දයෙන් වන කරුණු දැක්වීම සිදු කිරීමට අපේක්ෂා කරමි. | - එම - |
| (ඇ) අංක PED 27 දරන 2005 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ඔක්තෝබර් මස 18 දින ඉදිරිපත් කර තිබුණි. | 2019 වර්ෂයේ නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාර | ත්‍රෛමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අමාත්‍යාංශයේ පැවැත්වෙන රැස්වීම් වලට සහභාගී වේ | චක්‍රලේඛ ප්‍රකාරව ආයතනය මඟින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 1994 අංක 07 දරන ගාලු උරුමය පදනමේ පනතේ 03 වන වගන්තිය අනුව | පදනමේ කටයුතු සම්බන්ධ කාර්යසාධන වාර්තාවක් සකස් කර නොතිබුණි.2016 වර්ෂයෙන් පසු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කරමි. | කාර්යසාධන වාර්තාව නියමිත දිනට සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.223,182 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,359,778 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,582,960 ක් හෙවත් සියයට 116 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන රු.1,998,197 කින් එනම්, සියයට 19 කින් අඩු වීම අනෙකුත් ආදායම්වල ඇතුළත් කුලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.706,715 කින් එනම් සියයට 39 කින් අඩු වීම මෙම පිරිහීමට බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

-----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵල අතිරික්තයක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය ඌනතාවයක් බවට පත් වී තිබුණි. සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී දායකත්වය 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වැඩි වී තිබුණු අතර 2017 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂය තුළ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 26 කින් හා සියයට 20 කින් අඩුවී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ මුළු ආදායම හා සමස්ථ අතිරික්තය අතර අනුපාතය සියයට 16 ක් වූ අතර, 2016 වර්ෂයේදී එය සියයට 22 දක්වා වැඩි වී ඇති අතර, 2017 වර්ෂයේදී එම අනුපාතය සියයට 9 දක්වා අඩු වී ඇති බවත් සමාලෝචිත වර්ෂයේදී එම අගය සියයට (2) දක්වා අඩුවී ඇති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනතේ 5(1) වගන්තියට අනුව පදනමේ කටයුතු පරිපාලනය, කළමනාකරණය හා පාලනය කළමනාකරණ මණ්ඩලය වෙත පවරා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා කළමනාකරණ මණ්ඩලය රැස් වී තිබුණේ හතර වතාවක් පමණක් වන අතර කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් 26 දෙනෙකුගෙන් සමන්විත වුවද, ඒ රැස්වීම් සඳහා සියළුම සාමාජිකයන් එකවර සහභාගි වී නොතිබුණි. එසේම කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් අතුරින් පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා සමාලෝචිත වර්ෂයේ කිසිදු රැස්වීමකට සහභාගි වී නොතිබුණි. | කළමණාකරණ රැස්වීම් පවත්වන දිනයන් තීරණය කරනු ලබන්නේ සභාපති විසිනි. 2018 වර්ෂයේ රැස්වීම් 04 ක් පවත්වන ලදී. 2018 10.06 වන දින රටේ ඇති වූ දේශපාලන අස්ථාවරය මත කළමණාකරණ කමිටුව කැඳවීමට නොහැකි වී ඇත.<br><br>කළමණාකරණ මණ්ඩල කමිටු රැස්වීම් පිළිබඳ විධිමත්ව සාමාජිකයන් දැනුවත් කර ඇත. | කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්විය යුතුය.සියළුම සාමාජිකයින් හැකි උපරිමයෙන් සහභාගී කර ගත යුතුය. |
| (ආ) | පදනමට වැඩි බලතල හිමිකර ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම යන අරමුණු සඳහා 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධන කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ ගාලු උරුමය පදනම නිවාස, ඉදිකිරීම් හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බැවින්, මෙකී පවත්නා සංශෝධන සඳහා අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | පනත සංශෝධනය කිරීමේ කටයුතු හැකි ඉක්මනින් අවසන් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 මුල් කාර්තුවේදී සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් යුනෙස්කෝ සංවිධානය වෙත ලෝක උරුම ගාලු කොටුව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් සංරක්ෂණ සැලසුම් හා ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීමට අදාළව පදනම වෙත පැවරී ඇති කාර්යභාර්ය, වගකීම් හා පදනමේ සිදු කළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | සංරක්ෂණ වාර්තා සැකසීම මෙම වර්ෂයේ තෝරාගත් ගොඩනැගිලි 06 ක් සඳහා සිදුකරමින් පවතී. ඉදිරි වර්ෂ වලදී ද මෙය ක්‍රියාත්මක වීමට නියමිතය. | පැවරී ඇති වගකීම් ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යුනෙස්කෝ සංවිධානය විසින් ගාලු කොටුව ලෝක උරුමයක් ලෙස නම් කර තිබූ අතර, ඒ අනුව ගාලු කොටුව ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය වෙත ඉදිරිපත් කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ යුනෙස්කෝ සංවිධානයේ මගපෙන්වීම් (guideline) වලට අනුකූලව කටයුතු කිරීමට ගාලු උරුමය පදනමේ කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පැවරී ඇති කාර්ය භාර්ය විධිමත්ව ක්‍රියාවේ යෙදවීමට යුනෙස්කෝ සංවිධානය විසින් නිර්දේශ කළ පරිදි සුදුසුකම් සහිත කර්ය මණ්ඩලයක් ගාලු උරුමය පදනම යටතේ රාජකාරී කටයුතු කළ යුතුය. යෝජිත කාර්ය මණ්ඩලය වර්තමාන අමාත්‍යාංශය යටතේ නැවත ඉදිරිපත් කර ඇත. | කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගාල්ල - කොටුව තුළ දැනට හඳුනා ගෙන ඇති අනවසර ඉදිකිරීම් 22 ක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකරණ මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට ගාලු උරුමය පදනමට නීතිමය ප්‍රතිපාදන නොමැති අතර සෙසු රාජ්‍ය ආයතන ඒ සඳහා කඩිනමින් යොමු කිරීමේ හැකියාවද අවම මට්ටමක පැවතුණි. මෙම තත්ත්වය ගාලු උරුමය පදනම ස්ථාපිත කිරීමේ අරමුණු ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි. | දැනටමත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග 36 ක් ගෙන ඇත. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අදාළ සියළු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 1.3.2 වගන්තිය ප්‍රකාරව මුදල් සැපයීමේ මූලාශ්‍රය නොතකා මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සියළු ප්‍රසම්පාදනයන්ට අදාළ වුවද, එකතු වටිනාකම රු.589,658 ක් වූ මිලදී ගැනීම් 05 ක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. | V18/01/01<br>සභාපති තුමාගේ අනුමැතිය යටතේ දම්රෝ ආයතනයෙන් උක්ත මිල දී ගැනීම සිදු කරන ලදී.<br><br>V18/03/17<br>2017 වර්ෂයේ දෙසැම්බර් මස මිලදී ගන්නා ලද මිලටත් වඩා අඩු මිලට මිලදී ගැනීම සිදු කරන ලදී.<br><br>V18/05/06<br>නිවැරැදි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ උක්ත සේවාවන් ලබා ගෙන ඇත. | ප්රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | V18/09/26<br>ඉලේපෙරුම මෝටර් රථ ආයතනය ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සැපයුම්කරුවන්ගේ ලේඛනය පදනම්ව තෝරා ගෙන ඇත. | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 2.11.3 (අ) වගන්තිය ප්‍රකාරව කමිටුවේ රැස්වීම්වල වාර්තා ප්‍රසම්පාදන අත්පොත් අඩංගු නිශ්චිත ආකෘතියට අනුව වාර්තා ගත කළ යුතු අතර එය පැමිණ සිටින සාමාජිකයන් විසින් සහතික කළ යුතු වුවද, ප්‍රසම්පාදන තීරණ සාමාජිකයන්ගේ සහතික වීම් නොමැතිව බව ලබා ගෙන තිබුණි. | පිලිගනිමි. දක්වා ඇති ප්‍රසම්පාදන තීරණ සාමාජිකයන්ගේ එකඟත්වය මත එළඹ ඇත. නමුත් අදාල තීරණ, ප්‍රසම්පාදන තීරණ වාර්තා කරන ලේඛනය තුළ අන්තර්ගතකොට අත්සන් ලබා ගැනීමේ ප්‍රමාදයක් සිදුව ඇත. ඉදිරියේදී එවැනි අතපසුවීම් සිදු නොවීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගාලු කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රයෝජනය සඳහා වැසිකිළි සංකීර්ණයක් ඉදි කිරීම, සඳු අට්ටාලයේ ප්‍රදර්ශන මැදිරියේ සංරක්ෂණ කටයුතු හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා රු.14,800,000 ක් වෙන් කර තිබුණද, වැසිකිළි සංකීර්ණයේ කටයුතු හා සඳු අට්ටාලයේ ප්‍රදර්ශන මැදිරියේ සංරක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර තොරතුරු මධ්‍යස්ථානය සඳහා රු.1,030,129 ක් ගෙවා ලී බඩු උපකරණ මිලදී ගෙන තිබුණද, එහි වැඩි දියුණු කිරීමේ කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | සංචාරකයින් ආකර්ශණය කර ගැනීමත් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමටත් සැලසුම් කළ පරිදි ගත යුතු ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිපාලන නිලධාරී තනතුර ඇතුළු තනතුරු 07 ක පුරප්පාඩු පැවැති අතර, පරිපාලන නිලධාරී තනතුර සඳහා 2006 ජනවාරි 02 දින සිට කොන්ත්‍රාත් පදනම මත නිලධාරිනියක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වාර්ෂිකව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් තිබුණි. | පරිපාලන නිලධාරිය මෙම තනතුරෙන් විශ්‍රාම ගැනීමට නියමිතව සිටියත්, රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය මත අමාත්‍යාංශ මාරු වීම නිසාත් ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂක තනතුරත්, සභාපති තනතුරත් පුරපාඩු පැවති තත්ත්වයක ආයතනයේ සුරක්ෂිතතාවය සහ පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය සලකමින් පරිපාලන නිලධාරි රඳවා ගැනීමට සිදු වි | පුරප්පාඩු විධිමත්ව පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුමත කාර්ය මණ්ඩල තුළ සංවර්ධන සහකාර තනතුරු 06 ක් සඳහා නිලධාරීන් බඳවා නොගෙන සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සිටින සංස්කෘතික නිලධාරීන් තිදෙනෙකු ව්‍යාපෘති සහකාර නිලධාරීන් ලෙස 2006 වර්ෂයේ සිට අනුයුක්ත කර ගෙන තිබුණි. | දැනට මෙම ආයතනය අයත් වන්නේ සංස්කෘතික අමාත්‍යාංශය වේ. ඒ අනුව එම නිළධාරින් තුන්දෙනා අනුයුක්ත කර ඇත. ගාලු කොටුව සඳහා යුනෙස්කෝ ආයතනය මගින් කළමණාකරණ සැලැස්මක් අනුමත කර ඇත. කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කරගෙන යයි. | අනුමත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |